# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## අධ්‍යාපනවේදී උපාධි ප්‍රථම වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2018

## BED 2101 - අධ්‍යාපනයේ දාර්ශනික හා සමාජ විද්‍යාත්මක පදනම

**පැය තුනයි (03)**

**(අ) කොටසින් පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකක් ද**

**(ආ) කොටසින් හයවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකක් ද වශයෙන් ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.**

*** එක් එක් කොටසට අදාළ පිළිතුරු වෙන වෙනම පොත්වල ලියා වෙන වෙනම බාර දෙන්න.**
*** ඒ ඒ පිළිතුරු පොත්වල මුල් පිටුවේ ඉහළ දකුණු කෙළවරේ අදාළ කොටස් නාමය ලියන්න.**
*** 1 සහ 6 වන ප්‍රශ්නවලට ලකුණු 20 බැගින් ද අනෙක් ප්‍රශ්නවලට ලකුණු 15 බැගින් ද වෙන් කෙරේ.**

---

<u>අ - කොටස</u>

1. i. අධ්‍යයනය හා අන්විචලායයන් අතර පවතින සබඳතාව කෙබඳු දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 4)

ii. අධ්‍යාපනයත් දර්ශනයත් අතර ඇති සබඳතාව අවධාරණය කෙරෙන හේතූන් දෙකක් (02) ලියන්න.

(ලකුණු 4)

iii. විඥානවාදී අධ්‍යාපන න්‍යායේ මූලික දාර්ශනික අදහස් දෙකක් (02) ලියන්න.
(ලකුණු 4)

iv. අධ්‍යාපන දර්ශනය හැදෑරීම තුළින් ගුරුවරයකුට අත්වන ප්‍රතිලාභ හතරක් (4) ලියන්න.

v. මහත්මා ගාන්ධිගේ අධ්‍යාපන යෝජනා දෙකක් ලියන්න. (ලකුණු 4)

2. i. ස්වභාව ධර්මවාදී සහ උපයෝගිතාවාදී දාර්ශනික න්‍යායන්ගේ මූලික දාර්ශනික අදහස තුලනාත්මකව පහදන්න.

(ලකුණු 7)

ii. ස්වභාව ධර්මවාදී න්‍යායයෙන් අවධාරණය කරන අධ්‍යාපනික අදහස් හතරක් (4) නම් කොට එයින් දෙකක් (2) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

3. i. අධ්‍යාපන සංකල්පයේ ස්වභාවය උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. අධ්‍යාපනය ලබාගැනීමේ මාර්ගයක් ලෙස, නොවිධිමත් අධ්‍යාපනයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

4. i. අධ්‍යාපනවේදී උපාධිධාරියකු විසින් අධ්‍යාපනයේ දාර්ශනික පදනම විෂය හැදෑරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. උපයෝගිතාවාදීන් යෝජනාකල ඉගැන්වීම් ක්‍රම වත්මන් අධ්‍යාපනය සඳහා කොතෙක් යෝග්‍යවේද? සාකච්ඡා කරන්න.

(ලකුණු 8)

5. i. මහත්මාගාන්ධි තුමාගේ දාර්ශනික පැතිකඩ පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. "ගාන්ධි අධ්‍යාපන චින්තනය" විසිඑක්වන සියවසට අදාළ කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 8)

## ආ - කොටස

6. i. අධ්‍යාපන සමාජ විද්‍යාව හැදෑරීමෙන් ගුරුවරයකුට ලැබෙන ප්‍රධාන ප්‍රයෝජන හතරක් දක්වන්න.

ii. සංස්කෘතික දරිද්‍රතාව අධ්‍යාපනයට සම්බන්ධ වන ආකාරය පෙන්වා දෙන්න.

iii. පාසලක සැඟවුනු විෂයමාලාවට අදාළව ගුරු ආකල්ප හා ගුරු චර්යාව ශිෂ්‍ය සමාජානුයෝජනයට බලපාන ආකාරය පෙන්වා දෙන්න.

iv. පාසල, සමාජ වෙනස්වීමට දායක කර ගැනීමේ දී පවතින බාධක හතරක් දක්වන්න.

v. වාර්ගික සමාජානුයෝජනය තුළින් සම අධ්‍යාපන අවස්ථාවන් සඳහා ඇතිකෙරෙන බලපෑම පෙන්වා දෙන්න.

(ලකුණු 4x5= 20)

7. i. සංස්කෘතියේ ස්වභාවය හඳුන්වා එය අධ්‍යාපනයට සම්බන්ධ වන ආකාරය විග්‍රහ කරන්න.

(ලකුණු 7)

ii. සංස්කෘතියක දැනුම ආකල්ප, කුසලතා පාසලින් පවරා දෙන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 8)

8. i. සමාජ සමූහ සංකල්පය සමාජ විද්‍යාත්මකව හඳුන්වා, විධිමත් සමූහ පාසලේ ක්‍රියාවලියට බලපාන අන්දම පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. පාසල නැමති විධිමත් සමූහය තුළ අවිධිමත් සමූහ ක්‍රියාත්මක වන ආකාරය පෙන්වා දී පාසලට හිතකර ලෙස අවිධිමත් සමූහ හසුරුවා ගන්නා අන්දම විග්‍රහ කරන්න.

(ලකුණු 8)

9. i. පහත දක්වා ඇති තත්ත්වයන් සඳහා සමාජ පන්තික බලපෑම පෙන්වා දෙන්න.

(i) අධ්‍යාපන ප්‍රවේශය

(ii) අධ්‍යාපන උපයෝජනය

(iii) අධ්‍යාපන සාධනය

(iv) අධ්‍යාපන ඵල (ලකුණු 8)

ii. වර්තමාන ශ්‍රී ලාංකික අධ්‍යාපනය තුළ පහළ සමාජ පන්තිය සඳහා පවතින බාධක විශ්ලේෂණය කරන්න.

(ලකුණු 8)

10. i. වෘත්තියක් වීම සඳහා තිබිය යුතු නිර්ණායක විස්තර කරන්න.

(ලකුණු 7)

ii. ගුරු වෘත්තීමය තත්ත්වය සඳහා තිබිය යුතු අංශ මොනවාද? ඔබගේ පිළිතුර උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 8)

○o○o○o○o○o○o○o○o